

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| 56 වන කාණ්ඩය | බු.ව.2557 දුරුතු මස පුරපසළොස්වකද ක්‍රි.ව.2014 ජනවාරි මස 15 වන ද | 09 වන කලබ |
|---|---|---|

# දම්පල් වසරයි මේ !

මල්වලටත් වඩා හැඩ පාටින් පාට
බෝසත් ගුණ දහම් සුරකින හැම දට
පින්වත් කමින් බබළන සඳු ලෙස රෑට
හැම ද අවුරුදු යි හෙළ බොදු ළමයාට

වෙසෙස් වසරක් ය ආයේ අප සැමට
පසස් මෙහෙවරක් කළ සසුනට දැයට
දහම්පල් හිමිඳු ගුණ සමරා සොඳට
සිරස් නමමු අපි හැම එක් වී එකට

උපත් එක් සියක් පනහක් වස් පිරෙන
සැත්තැම්බර මාසෙ දහත් වන එදින!
දම්පල් පැතුම් පුබුදු මුළු රට නගන
මෙහෙවර කරමු අදිටන් පෙරටු ව නිතින

**- අනඳ**



# අලසකම

අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය වැලිගම ඤාණරතන
මහානායක මා හිමිපාණන් වහන්සේ විසිනි

අලසකම සියලු අභිවෘද්ධිය ම සිඳ බිඳ දමයි. අනලස් වී ක්‍රියා කිරීමෙන් ලැබිය නො හැකි සම්පතක් නොමැත. මෙලොවින් දියුණුවනු කැමති අය ගොවිකම් වෙළෙඳම් ආදි වූ රැකීරක්ෂාවන්හි හා ශිල්ප ශාස්ත්‍රාභ්‍යාසය නම් වූ සිප් සතර ඉගෙනීමෙහි ද අනලස් විය යුතු.

‘උද්‍යමෙන හි සිධ්‍යන්ති - කාර්යාණි න මනොරථෛඃ
න හි සුප්තස්‍ය සිංහස්‍ය - ප්‍රවිශන්ති මුඛෙ මෘගාඃ ’’

සියලු කාර්යයෝ උත්සාහයෙන් ම සිදුවෙත්. මනදෙලින් පමණක් සිදු නොවෙත්. නිදිගත් සිංහයාගේ කටෙහි මුවෝ නො පිවිසෙත් යනු යට දැක්වූ ශ්ලොකයෙහි අදහස යි. මෙයින් හැම කාර්යයක් ම මුදුන් පමුණුවා ගැනීමට නම් අනලස්ව උත්සාහයෙන් ක්‍රියා කළ යුතු බව හොඳින් ප්‍රකට වන්නේ ය. මෙසේ අනලස්ව ක්‍රියා කිරීමෙන් මෙලොව පමණක් නොව පරලොව ද දිනිය හැකි බව "අප්පමත්තෝ උභෝ අත්ථෙ අධිගණ්හාති පණ්ඩිතෝ "යන දේශනා පාඨයෙන් ඔප්පු වේ. අලස කම නිසා ඇතැමෙක් දැන් ඉතා ශීත යැයි ද, දැන් ඉතා උෂ්ණ යැයි

ද, දූන් ඉතා සවස යැයි ද, දූන් ඉතා උදේ යැයි ද, දූන් ඉතා බඩගිනි යැයි ද, දූන් ඉතා බඩ පිරී යයි ද, කර්මාන්ත නො කරත්. මෙසේ නොයෙක් දේ කියමින් හා සිතමින් වෙසෙන අලසයා අර්ථ ලාභයෙන් පිරිහෙන හෙයින් අලස කම භෝගාපාය මුඛයකි.

වෙනෙකක් තබා සිය ගේ දොර වතුපිටි ඉඩකඩම් වත් හොඳින් අනලසව රැකබලා ගෙන පිරිසිදුව තබා ගන්නෝ මෙක ලැ කී දෙනෙක් වෙත් ද? ශරීරාවයව වූ අත පය හා දත කට ආදියවත් හොඳින් සෝදා ගෙන පිරිසිදුව තබා ගැනීමෙන් අනුන්ටත් පිළිකුලක් නො කොට තමන්ගේ නීරෝගතාව රැක ගන්නෝ පවා අල්ප වෙති.

පෙර ලක් වැසියන් අනලස් වූ හෙයින් මහ සයුරු වැනි වූ තිසා, කලා, මින්නේරිය, පරාක්‍රම සමුද්‍ර, ආදී වැව් කැනවීමෙන් ද. රුවන්වැලි, තිස්සමහාරාම, යුදඟනා, ජේතවන, අභයගිරි, ආදී අහස් උසැති මහ දාගැබ් බැඳවීමෙන් ද ලෝහප්‍රාසාද වැනි පුදුම මහා ප්‍රාසාද කැරවීමෙන් ද සැගිරි, සීගිරි, දඹුලු, මූලගිරි, ආදී දුර්ගමස්ථානයන් හි පවා නෙත් සිත් පිණවන විහාරාදිය කැරවීමෙන් ද වෙනත් නොයෙක් යන්ත්‍රෝපකරණාදිය නිපදවා නන් වැදෑරුම් හාස්කම් ඇති දේ කිරීමෙන් ද මුළු ලංකාවාසීන්ගේ පරිභෝගයටත් සෑහී සෙසුත් බොහෝ ධාන්‍ය පිටරටවලැ පවා යැවිය හැකි සේ ධාන්‍ය නිෂ්පාදනය කිරීමෙන් ද මෙරටැ ප්‍රයෝජනය පිණිස වස්ත්‍ර පවා සකස් කැර ගැනීමෙන් ද නොයෙක් අවස්ථාවන්හි පැමිණි සොළී, පාණ්ඩි ආදී පරදේශීන්ගෙන් රට දැය රැක ගැනීමට දිවි පුදා නොබා ඉදිරිපත් වීමෙන් ද දේශ

දේශාන්තරවලැ පවා ඇසූවන් විස්මය පත් කැරවීමෙහි සමත් වූ හොඳ නමක් තබා ගත් බවැ ඒකාන්ත සත්‍යයෙකි. එකල විසූ ඒ උදාර සිංහල වීරයන් නිසා ම " සිංහලයා පුදුම මිනිසෙකැ යි " නොයෙක් විටැ පිටරැටියෝ පවා කී හ.

මෙකලැ ද සිංහලයන් ගැන විදේශිකයන්ගේ සැලකිල්ලක් තිබේ නම් එය පැරැණියන් නිසාම ඇති වූවකි. දූන් දූන් බොහෝ දුරට ම සිංහලයන්ගේ හොඳ නම මැකීගෙන යන්නේ සිංහලයන්ගේ ම අලසකම නිසා බැවින් මැකීගෙන යන හොඳ නම නො මැකෙන ලෙස ආරක්‍ෂාකර ගැනීමට උත්සාහ වැඩීම ආත්ම ගෞරවය උපදවා ගැනුමකි.

පෙරැ ධාන්‍යාගාරයක් වැනි වූ මෙරටැ වැසියන්ගේ උදාසීන ගති නිසා ගොවිතැන් ආදිය පාළු වී ගිය හෙයින් පසුගිය මහා යුද්ධ කාලයේ දී පිටරටින් එවූ සහල් ස්වල්පයත් නො ලැබුණා නම් හාමතේ මැරෙන්නට වනු ඒකාන්ත ය. එතරම් බිහිසුණු කාලයෙකැවත් අතපය වෙහෙසා යම් කිසිවක් වවාදිගාකැර ගැනීමෙන් ටිකක්වත් සූදානම් වූයේ ස්වල්ප දෙනෙකි. නොයෙක් විට රජයෙන් හා පුවත්පත් වලින් ද, ප්‍රසිද්ධ කථාවන්ගෙ න් ද "වැඩියෙන් වගාකරන්නටයයි" කළ ප්‍රකාශ බොහෝ දෙනෙකුට බීරි අලින්ට වෙණ ගැමක් වැනි විය. බොහෝ පිටිසර පළාත්වලැ පුරුදු ලෙසම කම්මැළි වැ විසූ බව තතු දන්නෝ දනිති. සමහරෙක් කාටත් වෙන එකක් අපටත් වෙච්චාවෙ යි කියමින් සිටියහ.

එසේ ම බොහෝ දෙනා ස්වකීය කර්මබලයෙන් ම සියල්ල සම්පූර්ණ වනතෙක් බලා සිටිති. එ ද මහත්ම අනුවණ කමෙකි. සියල්ල කර්මයෙන් ම සම්පූර්ණවෙතැ යි ඉගැන්වීමෙක් නැති. කර්මය හැම දෙයකට ම ප්‍රධාන විය හැකි ය. එහෙත් උත්සාහය නො යෙදුවොත් කර්මයෙන් ම සිදු නොවේ. අළු යටැ ගිනි තිබේ නම් එය දැල්විය යුත්තේ අළු ඉවත් කිරීමාදියෙනි. නො එසේ නම් ඉබේ සිදු නොවේ. කර්ම බලයෙන් සත්රුවන් ආදිය පහළවී තිබුණත් එය ගත යුත්තේ අත පය මෙහෙයීමෙනි. තලවලැ තෙල් ඇතත් මහන්සියෙන් ලබාගත යුතු ය. මේ ආදී උපමායෙන් සියල්ල කර්මයෙන් සිදු නො වන බව සිතාගත හැකි ය.

යථාහ්‍යෙකෙන චක්‍රෙණ - න රථස්‍ය ගතිර්භවෙත්
ඒවං පුරුෂකාර්යෙණ - විනා දෛවං න සිද්ධ්‍යති

එක රෝදයකින් රථය ගමන් නො කරන්නාක් මෙන් ම වීර්යයෙන් තොර වූ දෛවය කර්මය අර්ථසිද්ධි නො කරයි යනු අදහසයි. එබැවින් කර්මයෙන් ම සියල්ල සම්පූර්ණ වනතෙක් නො සිට අනලස්ව ක්‍රියා කළ යුතුයි.

එසේ ම තවත් බොහෝ දෙනා ශුභ නක්‍ෂත්‍රයන් (හොඳ නැකත්) බලමින් කාලය කා දමත්. එ ද අලසකම නිසා මිස අනෙකක් නොවේ. "අත්ථෝ අත්ථස්ස නක්ඛත්තං - කිං කරිස්සන්ති තාරකා" යමක් කරන්නට බලාපොරොත්තු වන දේ ම නැකත වන්නේ ය. තාරකාවෝ කුමක් කෙරෙත් ද නො කෙරෙත් ම ය. මේ බුද්ධ භාෂිතයෙන් දියුණුව සඳහා යමක් කරන්නට බලාපොරොත්තු වන්නා විසින් නැකැත් බලමින් හෝ කාලය අපතේ හැරිය යුතු නො වන බව හොඳින් තේරුම් යා යුතු ය.

තවත් බොහෝ දෙනා යම් කිසිවක් සඳහා වරක් දෙකක් මහන්සි ගෙන එය ව්‍යර්ථ වූ කල්හි උදාසීන වී සදහට ම එය අත්හැර දමති. එයත් නියම මනුෂ්‍යයන්ගේ ගතියක් නොවේ. "වායමෙථේව පුරිසෝ යාව අත්ථස්ස නිප්ඵදා" යන තථාගත දේශනාවෙන් බලාපොරොත්තුව මුදුන්පත් වෙන තෙක් ම මහන්සි ගතයුතු බව ප්‍රකාශ වන්නේය. මෙසේ දේශනා කොට වදාළේ "විරියවතෝ භික්ඛවේ කිං නාම න සිජ්ඣති" මහණෙනි, වීර්යවන්තයාහට සාර්ථක නො වන දේ නම් කුමක්ද යි යනාදී වශයෙන් නොයෙක් තන්හි දී වීර්යවන්තයාහට සියලු බලාපොරොත්තු ම මුදුන් පත් වෙන බවත් දේශනා කිරීමෙනි. මහා පරාක්‍රමබාහු මහරාජාණෝ ද දුදුරුඔයෙහි හෙයක් (පාලමක්) කැරවීමේදී පසුබටවූ සිය ඇමතියන් අමතා "ලෝකේ උස්සාවන්තානං ජනානං කිමසාධියං" ලෙව්හි උත්සාහවන්තයන්හට සිදුකළ නො හැකි දේ නම් කවරෙක්ද යි ප්‍රකාශ කළහ. මේ අගනා කීම අනුව උත්සාහවන්තයාට නො සැලසෙන මොන ම යහපතක් වත් නැත. ලෞකික දේ තබා ලෝකෝත්තර සම්පත් ද ලැබිය හැකි බව "විරියේන දුක්ඛං අච්චේති" වීර්යයෙන් දුක් සියල්ල ම එතෙර කරතැයි දේශනා කිරීමෙන් පෙනේ.

මේ කරුණු දන අනලසව ක්‍රියා කරන්නාගේ වීර්යය ප්‍රඥානුයාත නොවූ කල්හි ද (නුවණ මෙහෙයා නො කරන කල්හි ද) නියමෙ ඵල ලබා ගැනීමට දුෂ්කර වෙනවා ඇත. "පඤ්ඤානුයාතං විරියං වදන්ති සබ්බත්ථ සිද්ධිග්ගහණග්ගහත්ථං" නුවණින් කරන වීර්යය සියලු යහපත ම සලසා ගැනීමෙහි උතුම් අතකැයි පවසත්. යනු

නන්ද මහ තෙරුන් විසින් සිරිසඟබෝ කුමාරයාහට දෙන ලද අවවාදයෙකි. මෙයින් ද උත්සාහය ඵලදායී වීමට නම් නුවණින් කළ උත්සාහය පලවත් වූ බවට බුදුරජාණන් වහන්සේගේ බුද්ධත්වලාභය ම ප්‍රධාන උදාහරණයයි. ඒ හැර සෙසු ලොවී ලොවුතුරා සැප සාදාගත් උතුමෝ ඊළඟට නිදර්ශන වෙති. පෙරැ කසීරට දුප්පත් කෙනෙක් වීථියෙහි මැරී තිබුණ මීයෙකු විකුණා එයින් ලද මිළෙන් උක් සකුරු හා පැන් ද ගෙන වනයේ සිට විඩාවී එන්නන්ට වික්කේ ය. මෙසේ ක්‍රමයෙන් දියුණු වූ ඔහු අන්තිමේදී එනුවර ප්‍රධාන සිටුවරයා විය. මේ ප්‍රවෘත්තිය නිමිත්තෙන් තථාගතයන් වහන්සේ

"අප්පකේනපි මේධාවී - පාභතෙන විචක්ඛණෝ
සමුට්ඨාපෙති අත්තානං - අණුං අග්ගිංව සන්ධමං"

යන ගාථාවන් දේශනා කළ සේක. නුවණැත්තේ සුළු මිළයකිනුදු මහත් ධනයක් ලබා ගැනීමෙන් දියුණු වෙයි. මද ගිනිපුපුරකින් ලොකු ගින්නක් මොළවා (දල්වා) ගන්නාක් මෙනි යනු යටැ දක්වූ ගාථායෙහි තේරුමයි. එසේ ම කුම්භඝෝසකාදී අනන්ත කථාවන්ගෙන් ද අනලසව ක්‍රියා කිරීමෙන් ලත් ඉෂ්ට විපාක දත හැක්කාක් මෙන් ම ගජකුම්භ ජාතක, වරණ ජාතකාදියෙන් අලසකමේ අනිෂ්ට විපාකත් දැනගත හැකි ය.

කවුරුත් උත්සාහවන්තයෝ වෙත් වා !



# සියවස් සියපත සුවඳ

## (අතිගරු අම්පිටියේ ශ්‍රී රාහුළ නාහිමිපාණන් සිය වන වියට සැපත්වීම නිමිත්තෙනි)



වාතල පිස හමයි ගුණ මල් මකරන්දේ
යා කළ මහණකම සිල් පාමොක් කන්දේ
රාහුළ මාහිමිඳු ගුරු දෙව් ඇඳුරින්දේ
පාමුල හෙවැ පුදමි ආසී අරවින්දේ

පියතර බසින් සසුනේ පිළිවෙත පාද
ගිය ගිය තන්හි සත හට සුව සෙත සාද
සිය පින් සිරින් බබළන සඳු ලෙස පෝද
සිය වස් සුපිපි සියපත සැරදේ ලෝද

විදුරු'රම් බිමෙන් දුළ සදහම් ආර
විදුරුනැණ මහිමි පෑ එ සසුන් පාර
සොඳුරු ලෙස කෙළෙන් සිය සිසුනට බාර
ඇදුරු මඟ කළෝ ඔබ තව තව සාර

මඩිහේ මහා නාහිමියන් හා එකට
වැඩියේ එක මඟිනි හුරු සෝවුරු කමට
දැඩි වූ ගුරු බැතින් මහණුන් පුහුණුවට
එඩියෙන් තැතින් කළ මෙහෙ අද ලොව පළට

පිරිසිදු දහම් පිළිවෙත් සරු බවින් සැදී
පිරි මෙත් සිතින් සනහා නෙක දනන් හුදී
සිරිමත් ඇදුරිඳුනි මවු ගුණ සිසිල දිදී
දිරි දුන් මැනැවි මෙ ලෙස ම මතු සසරෙහිදී

- තිරිකුණාමලේ ආනන්ද අනුනාහිමි



# බලාපොරොත්තුව ...
## ඉලක්කය ඉටු වන තෙක්....

‘ගුරු සීයා’’ විසිනි

ලෝකයෙහි මිනිසුනට නොයෙක් ආකාරයේ, විවිධ මාදිලියේ බලාපොරොත්තු ඇත. මෙහි ලා බලාපොරොත්තු යන්නෙන් අදහස් කැරෙන්නේ යහපත, දියුණුව, ශුභ සිද්ධිය හා බැඳුණු බලාපොරොත්තු ය.

පලදාව බලාපොරොත්තුවෙන් ගසක් හෝ බීජයක් හෝ සිටුවන තැනැත්තා එතෙකින් නතර වුව හොත් ඔහු ගේ බලාපොරොත්තු කවරදකවත් සඵල නොවන්නේ ය. බීජයක් හෝ පැළයක් සිටුවා වතුර දැමීම, පොහොර යෙදීම, ගස වැඩෙන විට සතුන්ගෙන් බේරාගැනීම, රැකබලා ගැනීම ආදි දෑ කාලානුකූල ව සිදු කළ හොත් බලාපොරොත්තු වන පලදාව මැනැවින් ලබාගත හැකි වන්නේ ය.

‘‘කටයුතුවල දක්ෂ වූ පුරුෂයා තමා ඉලක්කය කැර ගත් අර්ථය සිදු වන තුරු ම තමා ගේ බලාපොරොත්තු අත් නො හරින්නේ ය. අතරතුරදී කොතරම් බාධා පැමිණුණත් නො කළකිරෙන්නේ ය.’’ යන්න බුදුපියාණන් වහන්සේ ගේ අවවාදයකි.

ආසිංසෙථේ'ව පුරිසො
න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො''

යන දේශනා පාඨයෙන් පැහැදිලි කැරෙන්නේ එම කරුණ යි. බෝසත් සිරිත ගැන හොඳින් විමසා බලන කල බුදුවීමේ බලාපොරොත්තුව කොතරම් නම් දිගු කලක සිට 'මනො ප්‍රණිධි', 'වාක් ප්‍රණිධි', 'කාය ප්‍රණිධි' වශයෙන් තබාගෙන ආයේ ද යන්න පැහැදිලි වේ. බෝසතාණන් වහන්සේ බුදුවීමට බලාපොරොත්තුවක් ඇති කර ගත්තේ මෙයින් විසි අසංඛ්‍ය කල්ප ලක්ෂයටත් පෙර දී ය. නව අසංඛ්‍ය කාලයක් මුළුල්ලේ මනෝ ප්‍රණිධි වශයෙන් හෙවත්, බලාපොරොත්තුව සිත තුළ තබාගෙන (සිතින් පැතීම් වශයෙන්) ඊට සුදුසු වන ලෙස කල් යැවූ සේක. සත් අසංඛ්‍යයක් කල් මුළුල්ලේ 'වාක් ප්‍රණිධි' වශයෙන් වචනයෙන් ද එය එළි දරවු කරමින් බුද්ධත්වය සඳහා පිළියෙළ වූ සේක. මෙ ලෙස සොළොස් අසංඛ්‍යයක් කල් ගෙවා, සුමේධ තාපස ව උපන් ආත්ම භවයෙහි දී දීපංකර බුදුරදුන් පා මුල දී ප්‍රථම නියත විවරණ ලබාගෙන එ තැන් සිට, 'කාය ප්‍රණිධි' වශයෙන් දශ පාරමිතාදි ලෝවැඩ සලසන කායික ක්‍රියාවන්හි නිරත වූ සේක. මේ කිසිදු කලෙක උන්වහන්සේ සිය බලාපොරොත්තුව අත් හළේ නැත. අවසාන සිද්ධාර්ථ බෝධිසත්ත්ව ආත්මභාවයෙහි පවා කෙනෙකුට සිතන්නට බැරි තරමේ දරුණු ව්‍රත, දුෂ්කර ක්‍රියා හමුවෙහි වුව ද, මාර තර්ජන බාධා අභියෝග හමුවෙහි වුව ද, නො සැලී ස්වකීය බලාපොරොත්තුව ඉටු කරගැනීමේ දැඩි වීර්යයෙන් අපරාජිතව ඉදිරියට ම ගමන් කළ සේක. කෙනකුට අභිමත ඉෂ්ටාර්ථය සිද්ධ කරගැනීම

සඳහා මීට වඩා විශිෂ්ට වූ උදාර උදාහරණයක් වෙන කොයින් ද?

දෛවවාදීහු තමන් ගේ දියුණුව දෛවය (වාසනාව) පිට තබා උත්සාහයත්, අධිෂ්ඨානයත් අත් හැර වාසය කරති. එබඳු අයට තිබෙන වාසනාව ද පිටමං වී අවාසනාවන්ත ව කල් යවන්නට සිදු වේ. උත්සාහයකින් තොරව වාසනාව වත් පෙර පින වත් මතු නොවන බව කල්පනා කරන ඥානවන්තයා උත්සාහයෙන් වීර්යයෙන් කටයුතු කොට සිය වාසනාවේ බලාපොරොත්තු මල් පල ගන්වා ගනී. උත්සාහවන්තයා කරා ලක්ෂ්මිය (සිරිදුව) ළඟා වන බව පුරාතන පඬුවෝ ද කීහ.

යහපත් බලාපොරොත්තු ඇති ව ඉලක්කයක් කරා යන තැනැත්තා දිගු කලක් ගත වුවත් ඉක්මන් නොවී, පමණ ඉක්මවා නො සිතා, ඉවැසීමෙන් පිළිවෙළට වැඩ කරන්නෙක් වෙයි. තමාට මුහුණ දෙන්නට සිදු වන අභියෝග බාධා සියල්ල හමුවෙහි නො සැලී ඒවා ද ජයග්‍රහණයට අත්වැල් කැරගනී. ජීවිතයේ විඳින්නට සිදු වන පරාජයන් ජයග්‍රහණය ගොඩනංවා ගන්නා ටැම් ලෙස හෙතෙම කල්පනා කරයි.

පැරැකුම්බා මහ රජතුමන් දදුරු ඔයේ දිය කඳ අවුරා අමුණු බැම්මක් බඳින්නට යෝජනා කළ කල්හි ඇමතිවරු ''මහ රජතුමනි, එය පෙර රජදරුවන්ටත් කරගත නොහැකි වූ අමාරු කාරියකි. ඒ සඳහා යොදන උත්සාහයත් ධනයත් නිෂ්ඵලය''යි කියද්දීත්, රජතුමා ''ඇමතිවරුනි, රාම කුමාරයාට වඳුරන් ලවා මහ මුහුද අවුරා ගල් බැම්මක්

දැමිය හැකි වුණා යයි කියන්නේ නම් ඔබ වැනි බුද්ධිමත් ඇමැතිවරුන් ලවා ගඟ අවුරා අමුණක් බඳින්නට නොහැකි වන්නේ කෙසේ ද යි පවසා තමා ද එම කාර්යයට බැස ඇමැතිවරුන්ට ද ධෛර්යය ලබා දුන්නේ ය. වැඩ නිමවූ පසු වැඩ කළ ජනතාවට රජතුමා රිදියෙන් ත්‍යාග ප්‍රදානය කෙළේ ය. ''රිදී බැඳි ඇල'' නිර්මාණය වුණේ එ පරිද්දෙනි.

ලොකෙ උස්සාහවන්තානං

ජනානං කිම'සාධියං''

'ලෝකයෙහි පසු නොබසින උත්සාහ ඇති අයට සිදු කරගත නොහැකි දේ කුමක් ද'' යන පැරකුම්බා රජු ගේ ශ්‍රේෂ්ඨ උදාන වාක්‍යය අපේ සියලු දරුවන් ගේ ද අධිෂ්ඨාන වාක්‍යය විය යුතු ය. දුටුගැමුණු පැරකුම්බා පරපුරින් එන සිහළ බොදු දරුවනට දිරියෙන් ඉදිරියට යෑම, අධිෂ්ඨානයෙන් බලාපොරොත්තු සපුරා ගැනීම මිස අතරමඟ නැවැතී ආපසු ඒම , මට එය නොහැකි යි නියා පසුබෑම කිසිසේත් සුදුසු වන්නේ නැත.

''අපි අතරමානානං - ඵලාසා'ව සමිජ්ඣති ''

නිසිකලට පෙර ඉක්මන් නොවී , යුහුසුළු නොවී, බලාපොරොත්තු ඇති ව කල් යල් දැන කටයුතු කරන ඇත්තනට සිය අභිමතාර්ථය (බලාපොරොත්තු වන දියුණුව) ඒකාන්තයෙන් ඉෂ්ට කරගත හැකි ය'' යන ගාමණී ජාතකයෙහි එන වටිනා අදහස අපේ දරුවන් නිතර සිහිපත් කළ යුතු ය.

ආධ්‍යාත්මික අංශයෙනුත් බාහිර අංශයෙනුත් බලාපොරොත්තු සඵල කරගත් උදාර චරිත අපගේ

ආගමික ඉතිහාසය තුළත් ජාතික ඉතිහාසය තුළත් පිරී පවතී. බලාපොරොත්තුවේ ගිනි සිළුව නො නිමෙන පරිදි දල්වාගෙන, මැනැවින් පිළිවෙළට පිළියෙළ වී අධිෂ්ඨානයෙන් වීර්යයෙන්, එහෙත් අනවශ්‍ය වී ඉක්මන් වීම් නොමැතිව, නුවණින් දිරියෙන් ඉදිරියට ම යන දරුවෝ පෙර මහ රජදරුවන්, මහ විරුවන්, මහ පඬිවරුන් මෙන් අපේ මාතෘ භූමිය, අනාගත ජාතික ඉතිහාසය ඉතා ශෝභමාන කරනු නොඅනුමාන යි.

අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් ලියූ පහත දැක්වෙන කවිය ද කට පාඩම් කරගෙන අපේ පින්වත් දරුවෝ බුදු සසුනත් රටත් ජාතියත් බසත් බබුළුවන්නට නිරතුරුව ම දිරි දරත් වා! ඉදිරියට ම යෙත් වා!

''තරයේ වැර වඩවු
නුවණින් ඉදිරියට යවු
පසුබට නො වවු මඳකුත්
දියුණුව පතන ළමයිනි''



# ආපසු බැලීම සහ ඉදිරියට සූදානම් වීම

'මුතු සීයා' විසිනි

ආදරණීය දුවේ ! පුතේ !

කිතුවස් දෙදහස් දහතුන වසර ගෙවී දෙදහස් දහහතරේ නව වසරේ ජනවාරි මස උදා වී අදට පහළොස් දිනක් ඉක්මී ඇත. ග්‍රීක දේව කථා සාහිත්‍යයයේ සඳහන් වන ජානුස් ජනවාරි මාසය හා සම්බන්ධ වූ දෙවියා ය. වසරේ පළමු මස ඔහුට හිමි ව ඇත. ඔහුට මුහුණු දෙකකි. එයින් එකක් පිටුපසට හැරී ඇත. අනෙක ඉදිරියට යොමු වී ඇත.

ජානුස් දෙවියා ගේ මේ දෙබිඩි මුහුණින් සංකේතවත් කෙරෙනුයේ අප සිත අප ජීවිතයේ අතීතයට සහ අනාගතයට යොමු කිරීම ය. ඉක්මුණු වසර දෙස ආපසු හැරී බැලීමට හා එළැඹෙන වසර දෙස බලාපොරොත්තු ඇති කර ගැනීමටත් ය. ජානුස් දෙවියා ගේ ඒ මුහුණු දෙක අපිත් මේ මාසය සඳහා ඉල්ලා ගනිමු.

එක වසරක් නිමා වී තවත් වසරක් උදාවන විට ඉකුත් වසරේ වූ අඩුපාඩු, වැරදි, සිදු වූ පාපයන් අකුසල් ආදී සියල්ල ම සමාලෝචනය කොට ඒවා නිවැරදි කර ගැනීම පළමුවෙන්

කළ යුතු ය. අනතුරු ව නව දිවියකට අනාගතය සැළසුම් කර ගත යුතු ය.

මේ නව වසරේ දී දූලා පුතාලා අලුත් පන්තිවලට උසස් වී ඇති නේ ද? පසු ගිය වසර අවසානයේ පාසලේ පවත්වන ලද වර්ෂාවසාන විභාගයෙන් කිසියම් විෂයකින් අඩු ලකුණු ලබා ඇත් නම්, ඒ විෂයයේ දැනුම වැඩිකර ගැනුම සඳහා මේ වසර මුල දී සිට ම උනන්දු විය යුතු ය. පසු ගිය වසරේ උදයේ පමා වී පාසලට ගියා නම් මේ වසරේ එසේ නොවන්නට වග බලා ගත යුතු ය. පසු ගිය වසරේ පන්තියේ දී කිසියම් දඟකාරකමක් හෝ නො ගැළපෙන විහිළුවක් හෝ කොට දඬුවමක් ලැබුවේ නම් ඒ වරද මේ වසරෙහි නො කරන්නට අධිෂ්ඨාන කර ගත යුතු ය.

භාවනාවෙහි යෙදෙන්නට වනගත වූ භික්ෂූන් වහන්සේලා පිරිසකට අමනුෂ්‍යයන් ගෙන් බාධා පැමිණි බව භාග්‍යවතුන් වහන්සේට සැල කළ සිටි විට ඔවුනට දේශනා කරන ලද මෙත්ත සූත්‍රයේ මුල දී දක්වා ඇති තම දියුණුව හෙවත් යහපත අපේක්ෂා කරන කෙනෙකු සතු විය යුතු ලක්ෂණවලින් අන්තිම ලක්ෂණය වන 'න ච ඛුද්දං සමාචරෙ කිංචි යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං' යන මේ උවදෙස ගැන ඔබ සිත මෙහෙයෙව්වා ද? උගතුන් විසින් වරද සහගත දෙයක් ලෙස ගැරහුණු, හැඳින්වුණු සුළු දෙයක හෝ නො හැසිරිය යුතු ය යන්න යි මේ පාඨයේ සාමාන්‍ය අරුත. ඔබට අපට ගැළපෙන සේ සාමාන්‍යයෙන් කියතොත් මේවා පස්පව් ය, දස අකුසල් ය. ඔබේ වයසේ සමහර දරුවෝ බරපතළ කම නොදැන අකුසල් කරති. ලෝ වැඩ සඟරාවේ ඇති මේ කව කියවා අවබෝධ කර ගන්න.

කෙළියට කඩක් සඟවා  යහළුවකු                    ගෙනේ
එළි කොට නැවත දුන් මිනිසකුට                 එතෙකිනේ
විළි වැස්මක් නො ලැබුණි දෙව් උනත්                අනේ
කෙළියට වත් නො කරවු සොරකමක්                 දැනේ

යහළුවකු ගෙන් රෙදි කඩක් සෙල්ලමට සොරා ගෙන ඒ පුවත දන්වා නැවත ආපසු දුන් මිනිසකුට දෙවියකු ලෙස ඉපදුණ ද ඔහුට විළි වැස්මක් නොලැබුණි. සෙල්ලමට වත් ඒ නිසා සොරකමෙහි නො යෙදෙන්න.

තුඹසකට තලගොයි පැටියකු පිවිසුණු විට සෙල්ලමට එය ගල්වලින් පුරවා ඇහිරූ ළමා පිරිසකට මරණින් පසු අත්වූ ඉරණම ඔබ අසා ඇතැයි සිතමි.

සුළු වැරදි කොට දෙගුරුන් ගේ දඬුවමින් බේරෙන්නට ළමයින් බොරු කියන අවස්ථා එමට ය. ඇත්ත කියා ලබන දඬුවම බොරු කියා දඬුවම නො ලබනවාට වඩා යහපත් ය.

බෝධිපාක්ෂීය ධර්ම අතුරෙන්, සතර සම්මප්පධානයට එසේ නැති නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සඳහන් වන  සම්මා වායමට හෝ ඔබේ අවධානය යොමු කරන්න.

මොනවාද ඒ ධර්ම සතර?

1 නූපන් අකුසල් නො ඉපදීමට වැර දැරීම
2 උපන් අකුසල් නැති කිරීමට වැර දැරීම
3 නූපන් කුසල් ඇති කිරීමට වැර දැරීම
4 උපන් කුසල් වැඩි දියුණු කිරීමට වැර දැරීම

ලැබූ මේ නව වසරෙහි දී යහපත් දෑ(කුසල්) වැඩීමටත් අයහපත් දෑ(අකුසල්) අත් හැරීමටත් දූලා පුතාලා වැඩි වැඩියෙන් වැර දරන්න.

ඔබ සැමට තෙරුවන් සරණයි!



# උතුරුතර මහ නා සමිඳුනි

**99 වන වියට පා තැබූ අතිපූජ්‍ය අග්ගමහාපණ්ඩිත දවුල්දෙණ ඤාණිස්සර ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහානායක මාහිමිපාණන් වහන්සේට දිගාසී පිණිස ය)**

උතුම් මා හිමිඳු සුපතළ දවුල්දෙණ
විකුම් පෑ වීර පරපුරකින් වඩින
රැකුම් සොයන වියතුන් හට සිතුම් මිණ!
එකුන් සිය වියට එළැඹේ හිමි මෙ දින

දැනුම හසළ මවු - පිය දෙදෙනකු පුත් ව
දහම උගත් තෙරිඳකු හෙවණට පත් ව
නියම නම පරිදි නුවණින් පොහොසත් ව
අගම වැඩ හිඳී හිමි වියතුන් කොත් ව

විදුදය පිරුවනින් ගෙන දම්-සත් එළිය
විදුදර වී යැ 'රන් හස් පට' ලැබ දිළි ය
අඳුරෙහි සිටින දන හට හිමි දෙන එළි ය
විදු දන කරති බුහුමන, එය පැහැදිළි ය

සකු බස් සක්විති යැ, සිලොවෙහි නිසග හුරු
අකුටිල ගුණය පිරු, බොරු තෙද නොමැති විරූ
දැකුමින් පහන් වන, මුව මඳ සිනා පිරූ
''ලොකුකම්'' නො මැති මහ නා හිමි සඳු යැ ගරු

උතුරුතර මහා නාහිමි අමරපුර
උතුරුතර ගුණෙන් සුදිලෙන සියලු වර
උතුරු බැති සිතින් වැඳ හිමි සරණවර
අතුරුවමු දිගාසී මල් පුබුදු කැර

\- ''ගුරු සීයා''



# මියන්මාරය

සිරි වජිරාරාම සාසන සාවිකා සමිතියේ ගරු ලේඛිකා
පුෂ්පා ජයවර්ධන මහාත්මනිය විසිනි

ඉතිහාසය තුළ මියන්මාරය හැඳින්වූයේ රාමඤ්ඤ දේශය ලෙසිනි. පසුව එය බුරුමය ලෙස හැඳින්වුණු අතර වර්තමානයේ භාවිතා වන්නේ මියන්මාරය ලෙසයි.

දුවේ, පුතේ, මියන්මාරය අපට ඉතාමත් වැදගත් රටක්. නැගෙනහිර ආසියා කලාපයේ උතුම් ථේරවාද බුදු දහමේ ආරක්ෂයා ලෙස හඳුන්වන්නේ මියන්මාරයයි. අප බුදු පියාණන් වහන්සේ පස් වරක් මියන්මාරයට වැඩම කළ බව එරට පුරාවෘත්තවල සඳහන් වේ. ක්‍රි.ව. 849-850 කාලය තුළ අනෝරථ රජු හා ශ්‍රී ලංකාවේ රජ කළ විජයබාහු රජු අතර ඉතා දැඩි මිත්‍රත්වයක් තිබූ බව පැරණි සෙල්ලිපිවල සඳහන් වේ. හත්වන ශතවර්ෂයේ දී මියන්මාරය තුළ ථේරවාදි බුදු දහම පිළිබඳ අති උත්කර්ෂවත් අවස්ථාවක් උදා විය. මෙම කාල සීමාවේදී ථේරවාදි බුදු දහම පිළිබඳ විශාල පොත් පත් ප්‍රමාණයක් මියන්මාර භාෂාවට පරිවර්තනය කර ඇත. පසු කාලීනව උපසම්පදා විනය කර්මය ශ්‍රී ලංකාවට ලබා ගෙන ඇත්තේ ද මියන්මාරයෙනි. අමරපුර සහ රාමඤ්ඤ යන නිකායන් දෙකම ආරම්භ කරනු ලැබ ඇත්තේ මියන්මාර රටෙහි උපසම්පදාව ලද ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේලා විසිනි.

පාලි භාෂාව පිළිබඳ මහා පඬිරුවනක් වූ, විසුද්ධි මග්ගය රචනා කළ බුද්ධඝෝෂ මහතෙරුන් වහන්සේ මියන්මාර ජාතිකයෙකු වශයෙන් සමහරු හඳුන්වති. මියන්මාර ජනතාව එකල අභිධර්මය ඉගෙනීම සඳහා විශේෂ උනන්දුවක් දැක්වූහ. එහි විසූ මණිරතන නම් මහතෙරුන් වහන්සේ නමක් අත්ථසාලිනි, සම්මෝහවිනෝදනී, කංඛාවිතරණී, අභිධම්මත්ථ විභාවිනී වැනි ග්‍රන්ථයන් මියන්මාර භාෂාවට පරිවර්තනය කර ඇත. අප රටේ වැඩ විසූ මහාචාර්ය රේරුකානේ චන්දවිමල මහානායක මාහිමිපාණන් වහන්සේ ද මියන්මාර භාෂාව පිළිබඳ හසළ දැනුමක් තිබූ උත්තමයෙකි. උන්වහන්සේ ද බුරුම රටට වැඩම කොට නිර්මල ථේරවාද බුදු දහම ප්‍රගුණ කළ උතුමාණ කෙනෙකි.

මියන්මාර තුළ විශාල වශයෙන් වෙහෙර විහාර දක්නට ඇති අතර ස්වේදගොන් චෛත්‍යය අති විශේෂ තැනක් හිමිකර ගනී. මියන්මාරයේ උක්කලාපප ප්‍රදේශයේ වෙළෙඳ දෙබෑයන් දෙදෙනකු වන තපස්සු භල්ලුක දෙදෙනා බුදුරජාණන් වහන්සේ බැහැ දැක විළඳ සහ මී පැණි පූජාවක් සිදු කළ බව සඳහන් වේ. එහිදී ධර්මය ශ්‍රවණය කිරීමෙන් පසු බුදු දහම වැළඳ ගත් මේ දෙදෙනාට බුදු පියාණන් වහන්සේ තම ශීර්ෂය කිහිපවිටක් පිරිමැද කේශ ධාතූන් වහන්සේලා කිහිප නමක් ප්‍රදානය කළ බව සඳහන් වෙයි. මෙම කේශ ධාතූන් වහන්සේලා තැන්පත් කර තනවන ලද්දේ මෙම ලෝක ප්‍රසිද්ධ ස්වේදගොන් චෛත්‍යයයි. මියන්මාර බෞද්ධයන් ගේ ජනප්‍රවාදවලට අනුව ස්වේදගොන් චෛත්‍ය තුළ පෙර වැඩ විසූ කකුසඳ, කෝනාගම සහ කාශ්‍යප යන බුදුරජාණන් වහන්සේලා භාවිත කළ ද්‍රව්‍යයන්ද තැන්පත් කොට ඇතැයි සැලකේ. පළමුවරට ඉදිකළ ස්වේදගොන් චෛත්‍යයේ උස අඩි 27 කි. වර්තමානයේ එය

අඩි 380 කි. මෙය මියන්මාරයේ විශාලතම චෛත්‍ය ලෙස හැඳින්වෙයි. එය වටා පරිවාර චෛත්‍ය විශාල සංඛ්‍යාවක් දැකගත හැකි ය.

තවත් විශේෂ ස්ථානයක් ලෙස සලකන (Rock Tempel kyaikhityo) පිහිටා ඇත. එය විශාල පර්වතයක් මත ඇති තවත් පර්වතයක මුදුනත පිහිටි චෛත්‍යයකි. එහි ගමන් කිරීම සඳහා විශේෂිත වාහන යොදා ඇති අතර, පුදුම උපදවන සුලු මෙම පිහිටීම, බැතිමතුන් තුළ මහත් ශ්‍රද්ධාවක් ඇති කරයි. මෙම චෛත්‍ය තුළ ද බුදුපියාණන් වහන්සේ ගේ කේශ ධාතුන්වහන්සේලා තැන්පත් කර ඇත.

ජන ප්‍රවාදවල සඳහන් වන ආකාරයට අප බුදු පියාණන් වහන්සේ මියන්මාරයේ අපරන්ත, සුනාපරන්ත, තාවතිංසා නිම්නය හා අරකන්ත යන ස්ථානවලට වැඩිබව දැක්වේ. ''අරකන්තහි'' රජ කළ චන්ද්‍රසූර්ය රජතුමාට දස රාජධර්මයෙන් රට පාලනය කරන්නට උපදෙස් දී ඇත්තේ ද මෙහි වැඩ සිටි සමයේදී ය.

මෙහි දක්නට ඇති වෙහෙර විහාර රන් ආලේපිත පූජනීය ස්ථානවීම විශේෂත්වයකි. එරට වැසියන්ගේ ජාතික ඇඳුම වන්නේ සරම සහ කමිසය වන අතර කාන්තාවන් ගේ ඇඳුම වන්නේ රෙද්දය සහ හැට්ටයයි. මියන්මාර වැසියන් ඉතාමත් චාම් හා ආචාරශීලි වන අතර නිතරම සිනහවකින් මුව සරසා සිටිනු දැක ගත හැකි ය. ගොවිතැන ප්‍රධාන ජීවිකාව වන අතර වනාන්තර සහ සුන්දර පරිසරයක් තවමත් දක්නට ඇත්තේ බුදු දහමේ ආභාසය නිසා විය හැකි ය.